**දේශීය සහ විදේශීය සංචාර සඳහා වසර පුරා ආධාර!!**

ආර්ට්ස් නෙට්වර්ක්ස් ඒෂියා (Arts Networks Asia-ANA ) මගින් ආසියාතික කලාකරුවන් සහ සංස්කෘතික ක්‍රියාකාරීන් සඳහා දේශීය සහ විදේශීය සංචාර වෙනුවෙන් ආධාර ලබා දෙනු ලැබේ. කලාපීය කලාකරුවන් අතර සහයෝගීතාව ඇති කිරීම සහ වැඩි දියුණු කිරීම, ඔවුනොවුන් හදුනා ගැනීම, බැදීම් ඇති කිරීම, ඔවුන් අතර සාකච්චා ඇති කිරීම හා පර්යේෂන සඳහා ඉඩ සැලසීම මෙහි අරමුණ වේ. මෙම සංචාර ආසියානු කලාපය තුල සිදු විය යුතු අතර ඒ සඳහා ඇමරිකානු ඩොලර් (US$) 1000 ක උපරිම මුදලක් පිරිනැමේ.

සවිස්තරාත්මක අයදුම් පතක් (Detailed proposal) සමග ජීව දත්ත තොරතුරු (CVs) සහ වියදම් පිළිබද ඇස්තමේන්තුවක් (Budget) ඉදිරිපත් කල යුතු වේ. නියමිත සංචාරයට මසකට පෙර අයදුම් පත අප වෙත ලැබිය යුතු අතර, අයදුම් පත සිංහල බසින් ඉදිරිපත් කරන්නේ නම් මාස දෙකකට පෙර අයදුම් පත අප වෙත ලැබිය යුතු බව කරුණාවෙන් සලකන්න.

කරුණාකර අයදුම් පත් පහත සඳහන් ඊමේල් ලිපිනයන් වෙත යොමුකරන්න.

mervyn@theatreworks.org.sg

taytong@theatreworks.org.sg

තෝරා ගත් ජයග්‍රාහී අයදුම් කරුවන් විසින්, සංචාරය නිමවී මාසයක කාලයක් තුලදී ව්‍යාපෘති වාර්තාව සමග ඡායාරූප සහ වීඩියෝ පට ආර්ට්ස් නෙට්වර්ක්ස් ඒෂියා (Arts Networks Asia) වෙත අනිවාර්යයෙන් එවිය යුතුය. මෙය පැහැර හරින අයදුම් කරුවන්ගෙන්, ලබා දුන් අධාර මුදල නැවත අයකර ගනු ලබන බව අවධාරණය කරනු ලැබේ.